**මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අරමුදල - 2022**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සමුච්චිත අරමුදල පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 69 ඡේදය ප්‍රකාරව වත්කමක් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද වටිනාකම රු. 25,832,345 ක් වූ වත්කමක් ක්‍රියාකාරී තත්ත්වයට පත් වී ඇත්තේ 2022 දෙසැම්බර් 29 දින වුවද සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීම නිසා ක්ෂය වටිනාකම රු. 5,124,005 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී වත්කම භාවිතයට ගැනීම පිළිබඳ සැලකිලිමත් නොවී ක්ෂය කර ඇත. 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී මෙම වරද නිවැරදි කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ස්වරූපයේ පරිගණක උපකරණ සහ දුරකථන ජාල නවීකරණ උපකරණ මිලදී ගැනීම සඳහා වැය කරන ලද වටිනාකම රු. 3,256,414 ක් වූ වියදම් 06 ක් අලුත්වැඩියා වියදම් ලෙස ගිණුම්ගත කර තිබිණි. | මේ යටතේ ඇති Sandblast sticker යොදා ආවරණය නිවැරදි ලෙස ගිණුම් ගත වි ඇත. අනෙක් වියදම් පරීක්ෂාකර වත්කම් ගිණුම්වලට සටහන් කර හා නියමිත පරිදි ක්ෂය ගැලපීම සිදු කර නිවැරදි කරමි. | ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත නොකළ යුතුය. |
| (ආ) | අනවසර ඉදිකිරීම් වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් අයකරන ලද රු. 372,000 ක් වූ සේවා ගාස්තුව ගොඩනැගිලි ඉදිකිරීම් ගිණුමට ප්‍රාග්ධනිත කර තිබුණි. | මෙම වියදම මූලධන වියදමක් ලෙස හඳුනාගැනීම නිවැරදි කරන බව දන්වා සිටිමි. | පුනරාවර්තන ස්වරූපයේ වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වෙබ් අඩවි සංවර්ධනය සහ උපකරණ මිලදී ගැනීම සඳහා ගෙවූ අත්තිකාරම් එකතුව රු. 1,667,100 ක් යන්ත්‍ර උපකරණ ගිණුමට හර කර තිබුණි. | අත්තිකාරම් ගෙවීම් යන්ත්‍ර උපකරණ ගිණුමට සටහන් කිරීමේ වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. | අත්තිකාරම් ගෙවීම් ප්‍රාග්ධනිත නොකළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂයේදී ගොඩනැගිලි එකතු කිරීම් සඳහා ගෙවිය යුතු රු. 595,778 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කිරීමේදී ගෙවිය යුතු ගිණුමෙන් ඉවත් කිරීම වෙනුවට ගොඩනැගිලි ගිණුමට එකතු කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වත්කම් වැඩියෙන් දැක්විණි. | අතපසුවීමකින් මෙය ගොඩනැගිලි ගිණුමට සටහන් වී ඇත. අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරමි. | අදාළ ගෙවීම නිවැරදිව හඳුනාගෙන අදාළ ගිණුමට ගැලපීම සිදු කළ යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විෂය** | **මුදල රු.** | **නොසැපයූ විගණන සාක්ෂි** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මුදල් ශේෂයට ගැලපීම් කර තිබූ | | | | |
| (i)හඳුනා නොගත් ඍජු ප්‍රේෂණ ලැබීම් | 10,395,572 | ලැබීම් තහවුරු කිරීමට අදාල ලියකියවිලි | මෙම හඳුනා නොගත් ලැබීම් හඳුනා ගැනිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | අරමුදලේ බැංකු සැසඳුමේ හඳුනානොගත් ගෙවීම් හා ලැබීම් ඉතා ඉක්මනින් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ii) හඳුනා නොගත් ගෙවීම් | 76,587,740 | ගෙවීම් වවුචර්, ගෙවීම් තහවුරු කිරීමට අදාල ලියකියවිලි | මෙම හඳුනා නොගත් ගෙවීම් හඳුනා ගැනිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | -එම- |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත හා සේවා පනතේ 20 (1) (අ) සහ 37 වගන්තිය | වෙළඳාමේ භාවිතා වන සියලුම මිනුම් උපකරණ වාර්ෂිකව සත්‍යාපනය කලයුතු වුවත් එසේ සෑම උපකරණයක්ම සත්‍යාපනය කරන බව තහවුරු කර ගැනීමේ නිසි ක්‍රමවේදයක් අරමුදල තුල මේ දක්වා ස්ථාපිත කර නොතිබුණි. | දැනට මුද්‍රා තැබීම සඳහා අළුත්වැඩියා කර තරාදි ඉදිරිපත් කරනු ලබන සේවා නියෝජිත ආයතන සහ පුද්ගලයින්ගෙන් තොරතුරු ක්‍රමානුකූලව ලබා ගෙන අනතුරුව සියළුම මිනුම් උපකරණ සඳහා ලියාපදිංචි අංකයක් ලබා දී විධිමත් දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇති අතර එහි ප්‍රගතිය මීලග විගණනයේදී වාර්තා කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 1647 (ආ) | වාහන සහ උපකරණ පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | වාහන පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/ 2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | රජයේ වාහන සෑම ඉන්ධන දහන පරීක්ෂාවකට පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසු හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ ඇති වාහන 17 සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ඉන්ධන දහන පරීක්ෂාව සඳහා වාහනයකට යෙදිය හැකි උපරිම ධාරිතාවයෙන් ඉන්ධන යොදා නොනවත්වා ධාවනය කළ යුතු වුවත් QR කෝටා ක්‍රමය මගින් ඉන්ධන සීමා කිරීම නිසා වාහනවලට ඉන්ධන සපයා ගැනීමේ ගැටලුවක් පැවතීම නිසා 2022 වසරේදී ඉන්ධන දහන පරීක්ෂාව සිදු කළ නොකරන ලදි. | චක්‍ර ලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.7 ආයෝජන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදලෙහි ජංගම ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු. මිලියන 95 සිට රු.මිලියන 201 දක්වා පරාසයක ශේෂයක් පවත්වාගෙන ගොස් තිබූ අතර මෙම ශේෂය අරමුදලේ මාසික අවශ්‍යතාවය හා සසඳන විට සියයට 63 සිට සියයට 97 දක්වා අතිරික්ත මුදලක් බව නිරීක්ෂණය විය. මෙම අතිරික්ත ශේෂය ඵලදායී ලෙස ආයෝජනය කර අරමුදල සඳහා පොලී ආදායම් උපයා ගත හැකිව තිබුණද, කළමනාකරණය විසින් ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට මාසික මුදල් අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ජංගම ගිණුමේ ශේෂ පරික්ෂා කර අතිරික්ත ශේෂ ආයෝජනය කිරීමට කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව 2023 ජනවාරි මස 17 දින රු.මි.50 ක්ද 2023 මාර්තු 27 දින මස රු.මි.20 ක් ද ලෙස ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. | ජංගම ගිණුමෙහි අතිරික්ත ශේෂය ඵලදායි ලෙස ආයෝජනය කර අරමුදල සඳහා පොළී ආදායම උපයා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 75,092,226 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 66,445,028 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,647,198 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමස්ථ වියදම රු. 8,885,858 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ආයතනික රාමුව ශක්තිමත් කිරීමේ පරමාර්ථය යටතේ ප්‍රධාන වශයෙන් මිනුම් ඒකක ප්‍රමිතීන්, සේවා පනත හා නීති රීති යාවත්කාලීන කිරීමේ ප්‍රගතිය සියයට 10 ක්ද අභ්‍යන්තර ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණ විසඳුම් හා මාර්ගෝපදේශ හඳුන්වාදීමේ ක්‍රමවේදයන්හි ප්‍රගතිය සියයට 20 ක්ද වශයෙන් අඩු මට්ටමක ප්‍රගතියක් පැවතුණි. | මේ සඳහා වෙළෙඳ අමාත්‍යාශ ලේකම් විසින් 2023.02.23 දින කමිටුවක් පත් කර ඇති අතර ඒ මගින් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ සංශෝධනයන් හා අභ්‍යන්තර ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික විසඳුම් හා මාර්ගෝපදේශ හඳුන්වාදීමේ ක්‍රමවේදයහි සංශෝධනවලට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. මෙයට සැලකිය යුතු කාලයක් ගත වනු ඇත. | සැලසුම් කළ කාර්යයක් වලින් අපේක්ෂිත ප්‍රගතිය ලඟා කරගත යුතුය. |
| (ආ) ජාතික මිනුම් විද්‍යාගාරයට ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීම සඳහා (ISO | මේ වන තෙක් විද්‍යාගාර දෙකක කටයුතු දැනටමත් ආරම්භ කර | සැලසුම් කළ කාර්යයක් වලින් අපේක්ෂිත ප්‍රගතිය |

| | | | |
|---|---|---|---|
| | 17025 ISO 9001) තාක්ෂණික විද්‍යාගාර 08 ක ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන ලෙස වැඩි දියුණු කිරීමට සැලසුම් කලද, විද්‍යාගාර 06 ක කටයුතු පමණක් සම්පූර්ණ කරගෙන තිබුණි. එමෙන්ම ජාත්‍යන්තර විශේෂඥයින්ගේ පුහුණුව, උපදේශනය මාර්ගගතව ලබාගැනීම සියයට 50 ක් ද සහ ජාත්‍යන්තර විශේෂඥයින්ගේ සමාලෝචනය ලබාගැනීම සියයට 40 ක් ද ඉටුකර ගෙන තිබුණි. | ඇති අතර අගෝස්තු මස අවසන් වන විට එම විද්‍යාගාරවල අපේක්ෂිත ප්‍රගතිය ලබා ගත හැක. මෙම කටයුතුවලදී ජාත්‍යන්තර විශේෂඥයින්ගේ උපදෙස් හා සමාලෝචන අපේක්ෂිත පරිදි ලබා ගැනීමට කටයුතු කෙරේ. | ලඟා කරගත යුතුය. |
| (ඇ) | දක්ෂ හා උගත් ප්‍රජාවක් ඇති කිරීම සඳහා මිනුම් දැනුම ව්‍යාප්ත කිරීම හා අන්තර් (ආශ්‍රිත) ආයතන අතර පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම යන අරමුණුවලින් ඉටුකරගෙන ඇති ප්‍රගතිය සියයට 18 ත් 50 ත් අතර මට්ටමක පැවතුණි. | මේ සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා න්‍යායාත්මක වැඩසටහන් දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර 2022 වර්ෂයේ පැවති අර්බුදකාරී වාතාවරණය (දේශපාලන හා ඉන්ධන ) තුළ එම ඉලක්ක සාක්ෂාත් කර ගැනීම නොහැකි විය. | -එම- |
| (ඈ) | දැනුවත් කිරීමේ වැඩසටහන් යටතේ වැටලීම් මඟින් ජනතාව දැනුවත් කිරීම සහ අවම කාලයක් තුළ පරීක්ෂණ ක්‍රියාවලිය නිම කිරීම තුලින් පරීක්ෂණ 60 ක් කිරීමට සැලසුම් කර තිබුණද ඉන් ඉටු කරගැනීම් පරීක්ෂණ 14 ක් පමණක් වූයෙන් ප්‍රගතිය සියයට 23ක් ව පැවතුණි. | මෙහි පාරිභෝගික පැමිණිලි සඳහා වැටලීම් සිදු කිරීම යන්න අදහස් කරන අතර වැඩසටහන් 60ක් සැලසුම් කර දිස්ත්‍රික්ක වෙත යොමු කර ඇති බවද, එම වැඩසටහන් දිවයින පුරා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ඇති මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශ මගින් සිදු කිරීමේදී ඇතිවන ප්‍රවාහන පහසුකම් හා පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් වැඩසටහන් 14ක්, එනම් 23%ක ප්‍රතිශතයක් ළඟා කර ගත හැකි විය. | -එම- |
| (ඉ) | දිස්ත්‍රික්ක 12 ක් තුළ මිනුම් ප්‍රමිතීන් නැවත සත්‍යාපනය කිරීමට සැලසුම් කර තිබුණද, දිස්ත්‍රික්ක 04 ක පමණක් එම කාර්යය ඉටුකර තිබුණි. | දිස්ත්‍රික් මිනුම් උපකරණ දෙපාර්තමේන්තු කාර්මික වැඩපල මගින් අළුත්වැඩියාවේදී විශාල කාලයක් ගතවීම සහ අනතුරුව ජාතික මිනුම් විද්‍යාගාරයේදී එම සම්මත උපකරණ ක්‍රමාංකනය කිරීම සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා ද ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වන බැවින් ද දිස්ත්‍රික් | -එම- |

| | | | |
|---|---|---|---|
| | | සම්මත උපකරණ එකවර ගෙන්වීමේදී දිස්ත්‍රික් රාජකාරි පවත්වා ගැනීමේ අපහසුතාවය නිසා දිස්ත්‍රික්ක 04ක එම කාර්යය ඉටුකර ඇත. | |
| (ඊ) | ජාතික ප්‍රතිපත්තිවලට අනුගත වූ ජාතික හා ජාත්‍යන්තර අරමුණු ඉටුකර ගැනීම සඳහා වැඩසටහන් 03 ක් සැලසුම් කර තිබුණද ,එකම වැඩසටහනක්වත් ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා න්‍යායාත්මක වැඩසටහන් සැලසුම් කර තිබූ අතර 2022 වර්ෂයේ පැවති අර්බුකාරී වාතාවරණය (දේශපාලන හා ඉන්ධන ) තුළ එම ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය. | සැලසුම් කළ කාර්යයක් වලින් අපේක්ෂිත ප්‍රගතිය ලඟා කරගත යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල හෝ ඊට පෙර දෙපාර්තමේන්තුව විසින් වාහන අලුත්වැඩියා කිරීම් හෝ සේවා කිරීම් සඳහා සැපයුම්කරුවන් ලියාපංදිචි කරගෙන නොතිබුණ අතර 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේහි 3.4 වන මාර්ගෝපදේශය ප්‍රකාරව සුළු වටිනාකමක් ඇති වැඩ හෝ සේවා ලබා ගැනිමේදී ලියාපදිංචි සැපයුම්කරුවන් අතරින් හෝ දුරකථන නාමාවලියේ කහ පිටු අතරින් තෝරාගත් සැපයුම්කරුවන් වෙතින් තැපැලෙන් ලබාගත් ලංසු 03 ක් හෝ 05 ක් අතරින් ඇගයිම් කර තෝරාගත් ලංසුකරුවන්ගෙන් අදාල සේවාව ලබා ගත යුතු වුවද ඊට පටහැනි ලෙස සේවා වාර 33 ක් (ලංසු කැඳවීමකින් තොරව) එකම සේවා ස්ථානයකින් සිදුකර රු. 1,350,605 ක් ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තුවේ ආදායම් උත්පාදන කටයුතුවලට අවහිර නොවන පරිදි අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා වසර ගණනාවක සිට අලුත්වැඩියා සිදු කළ ආයතනවලින් ලංසු කැඳවා සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති අවම ලංසුකරු මගින් එම කාර්යයන් සිදු කරන ලදි.2023 වසරේ සිට දුරකථන නාමාලියෙන් තෝරාගත් හෝමාගම ආසන්නයේ ආයතන ලේඛණය ඇසුරෙන් අළුත්වැඩියාව සඳහා වාහන යොමු කිරීමට/ ලංසු කැඳවීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොත පරිදි කටයුතු කළ යුතුය. |